මූල්‍ය බුද්ධි ඒකකය

நிதியியல் உளவறிதல் பிரிவு

FINANCIAL INTELLIGENCE UNIT

# පහත සඳහන් ව්‍යාපාර සහ වෘත්තීන් සමඟ කටයුතු කරන ගනුදෙනුකරුවන් වෙත කෙරෙන දැනුම් දීමයි

- **කැසිනෝ ව්‍යාපාර**
- **ඉඩම් හා දේපළ වෙළඳාම් ව්‍යාපාර**
- **වටිනා ලෝහ සහ අගනා මෙන්ම අර්ධ අගනා මැණික් ගල් වෙළඳාම් ව්‍යාපාර**
- **නීතිඥවරුන්, නොතාරිස් සහ වෙනත් ස්වාධීන නීති සේවා සැපයීම**
- **ගණකාධිකාරී සේවාවන්**
- **භාරයන් හා සමාගම් සේවා සපයන්නන්**

ඔබ ඉහත සඳහන් ව්‍යාපාර සහ වෘත්තීමය සේවාවන් සමඟ කටයුතු කරනු ලබන ගනුදෙනුකරුවකු නම් 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත මඟින් පනවා ඇති ගනුදෙනුකරුවන් හඳුනාගැනීමේ අවශ්‍යතාවය මත පහත තොරතුරු ඔබ වෙතින් ලබා ගැනීමට කටයුතු කරන ලෙසට ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය විසින් එකී ව්‍යාපාර සහ වෘත්තීන් වෙත විධිවිධාන පනවා ඇත.

- අනන්‍යතා ලේඛනයෙහි පිටපතක් (ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය)
- සම්පූර්ණ නම
- උපන් දිනය
- ස්ථිර පදිංචි ස්ථානයේ ලිපිනය හෝ තැපැල් ලිපිනය
- ජාතිය
- රැකියාව, සේවායෝජකගේ හෝ ව්‍යාපාරයේ හෝ ප්‍රධාන කටයුත්තේ නම
- දුරකථන අංක
- ගනුදෙනුවෙහි අරමුණ
- අරමුදල් මූලාශ්‍ර

**අන්තර්ජාතික වශයෙන් පිළිගනු ලබන මෙම ගනුදෙනුකරුවන් හඳුනාගැනීම සඳහා තොරතුරු ලබාගැනීමේ නීති, මුදල් විශුද්ධිකරණය මෙන්ම ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම උදෙසා, අප රට තුළ ද ක්‍රියාත්මකව පවතී. එබැවින් ඉහත සඳහන් ව්‍යාපාර සහ වෘත්තීමය සේවාවන් සමඟ ගනුදෙනු කරන ඔබ අවශ්‍ය තොරතුරු ලබා දීම මඟින් මෙම නෛතික අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා එම ආයතන වලට සහයෝගය ලබා දෙන ලෙසට මෙමඟින් දැනුම් දෙමු.**

*වැඩිදුර තොරතුරු:*
*2018 අංක 1 දරන නමෝද්දිෂ්ඨ මූල්‍ය නොවන ව්‍යාපාර (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති - 2018 ජනවාරි 10 දිනැති අංක 2053/20 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය.*

**ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**
**අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01**

**දු.අ.: 011-2477509** **ෆැක්ස්: 011-2477692** **වි.තැ: info@fiusrilanka.gov.lk** **වෙබ් අඩවිය: fiusrilanka.gov.lk**